# 2022 වර්ෂයේ අහිමි වූ කාලය සඳහා ප්‍රතිසාධන සැලැස්ම

(Recovery Plan for Learning Loss – 2022)

(6 ශ්‍රේණියේ පළමු වාරයේ කාලච්ඡේද 13 ක් ද දෙවන හා තෙවන වාර වල කාලච්ඡේද 18 ක් ද බැගින් කාලච්ඡේද 49ක් සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පවත්වාගෙන යාමට මෙම සැලැස්ම සකස් කර ඇත.)

# නර්තනය

## 6 ශ්‍රේණිය

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
www.nie.lk

| පළමු වාරය | | | | | |
|---|---|---|---|---|---|
| **නිපුණතාව** | **නිපුණතා මට්ටම** | **අත්‍යාවශ්‍ය ඉගෙනුම් ඵල** | **විෂය අන්තර්ගතය** | **ක්‍රියාකාරකම** | **කාලච්ඡේද** |
| 1.0<br>පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කරගනිමින් නර්තන නිර්මාණය කරයි. | 1.2<br>පරිසරයෙන් ලබන අත්දැකීම් ඇසුරෙන් චලන නිර්මාණය කරයි. | • මිනිස් හා සත්ත්ව චරිත වල ගමන් විලාස ප්‍රදර්ශනය කරයි.<br>• චලන ඉදිරිපත් කිරීමේ ස්වභාවය හා සමබරතාව පිළිබඳ අදහස් ප්‍රකාශ කරයි.<br>• චලන ක්‍රියාකාරකම් වල යෙදීමෙන් ශාරීරික නම්‍යතාව පවත්වා ගත හැකි බව පවසයි.<br>• භාව ප්‍රකාශන සහිතව චලන ඉදිරිපත් කරයි.<br>• සාමූහිකත්වයෙන් යුතුව චලන නිර්මාණ ඉදිරිපත් කරයි. | • විවිධ චලන නිර්මාණය කරමු.<br>➢ සත්ත්ව චරිත තෝරා ගැනීම<br>➢ චලන නිර්මාණය<br>➢ භාව ප්‍රකාශනය<br>➢ සාමූහිකව චලන නිර්මාණය | 1.2.1 විවිධ චලන නිර්මාණය කරමු. | 4 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 4.0<br>ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනා වල පසුබිම අධ්‍යයනය කරමින් ගායන කුසලතා ප්‍රදර්ශනය කරයි. | 4.2<br>නියමිත තාල රූප හා නාද මාලා අනුගමනය කරමින් ගායනා ඉදිරිපත් කරයි. | • නිවැරදි නාදමාලා අනුගමනය කරමින් නැළවිලි කවි ගායනය කරයි.<br>• නැළවිලි කවි ගායනයෙහි සුවිශේෂී ලක්ෂණ ඇති බව පවසයි.<br>• නැළවිලි කවි ගායනය කිරීමේ අවස්ථා හා අරමුණ විස්තර කරයි.<br>• ක්‍රියාකාරකම් වල යෙදෙමින් කවි ගායනය කරයි.<br>• සාමූහිකව හා ඒකලව ස්වකීය හඬ පාලනය කරමින් ගායනය කරයි. | • නැළවිලි කවි ගයනා රස විඳීම.<br>➢ නිවැරදි නාද මාලාව<br>➢ සුවිශේෂ ලක්ෂණ<br>➢ භාවිත අවස්ථා<br>➢ අරමුණ<br>➢ සාමූහිකව හා ඒකල ව ගායනය | 4.2.1<br>නැළවිලි කවි ගයා රස විඳීම. | 1 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2.0<br>නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රයෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | 2.2<br>පාද චලන හුරු කර ගැනීම සඳහා මූලික සරඹ ඉදිරිපත් කරයි. | • නමස්කාරය දැක්වීමේදී අනුගමනය කරන විධික්‍රම විස්තර කරයි.<br>• නමස්කාරය කිරීමේ අපේක්ෂා විස්තර කරයි.<br>• නර්තනයේ මූලික අංගහාරයෙහි සුවිශේෂී ලක්ෂණ විස්තර කරයි.<br>• පා සරඹ/මණ්ඩි පද කියමින් තාල තබයි.<br>• මණ්ඩියෙහි නිවැරදි ඉරියව් හා අංගහාර අනුගමනය කරමින් සරඹ පද හා හමාර පද ඉදිරිපත් කරයි.<br>• පා සරඹ/මණ්ඩි පද අභ්‍යාසයෙහි වැදගත්කම ප්‍රකාශ කරයි. | • නමස්කාරය<br>• පා සරඹ/මණ්ඩි පද 1 - 3 දක්වා<br>➢ හමාර පද නර්තනය<br>➢ නිවැරදි අංගහාර භාවිතය | 2.2.1<br>නැටුමට අවසර ගෙන පාද තබමු. | 4 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 4.0<br>ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනා වල පසුබිම අධ්‍යයනය කරමින් ගායන කුසලතා ප්‍රදර්ශනය කරයි. | 4.1<br>නියමිත ගායනා වල සංස්කෘතික පසුබිම විස්තර කරයි. | • නැළිවිලි කවි ගායන පිළිබඳ අදහස් ඉදිරිපත් කරයි.<br>• ලී කෙළි හා කළ ගෙඩි නැටුම් වලට අදාළ කවි ගායනා වල සංස්කෘතික පසුබිම විස්තර කරයි.<br>• දේශීය වන්නම් ගායනය සඳහා රචනා වී ඇති බව ප්‍රකාශ කරයි.<br>• ලී කෙළි/කළ ගෙඩි/නැළවිලි/වන්නම් හා බැඳි කවි රචනාවන් පිළිබඳ අගයමින් අදහස් දක්වයි.<br>• අදාළ කවි සංරක්ෂණය කර ගැනීම සඳහා යෝජනා ඉදිරිපත් කරයි. | • නැළවිලි කවි/ලී කෙළි/කළ ගෙඩි/හනුමා වන්නම/හනුමන්තා තාලය/අනිලා වන්නම හා බැඳි සංස්කෘතික පසුබිම විස්තර කිරීම. | 4.1.1<br>ශ්‍රී ලාංකේය ජන ගායනා හඳුනා ගනිමු. | 2 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 4.0<br>ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සැබැඳී ගායනා වල පසුබිම අධ්‍යයනය කරමින් ගායන කුසලතා ප්‍රදර්ශනය කරයි. | 4.1<br>නියමිත තිත් රූප හා නාද මාලා අනුගමනය කරමින් ගායනා ඉදිරිපත් කරයි. | • නිවැරදි නාද රටා අනුගමනය කරමින් ලී කෙළි කවි හා කළ ගෙඩි කවි ගායනා කරයි.<br>• නිවැරදි අක්ෂර උච්චාරණය කරමින් බෙර වාදනයට අනුව අදාළ කවි ගායනය කරයි.<br>• හඬ පාලනය කර ගනිමින් ඒකීය හඬ තලයක පිහිටා සාමූහිකව ගායනය කරයි.<br>• ස්වකීය හඬ තලය හඳුනා ගනිමින් ඒකල ගායනෙහි යෙදෙයි.<br>• ප්‍රකාශනය සහිතව ප්‍රාසාංගිකව ගායනය කරයි. | • ලී කෙළි කවි/කළ ගෙඩි කවි නිවැරදි නාද මාලාවට අනුව ගායනය<br>• ලී කෙළි කවි<br>1.එක පදුරෙන් ලී ..........<br>2.අහසේ දෙවියෝ.....<br>3.ඉරට ඔබිය........<br>• කළ ගෙඩි කවි<br>1.පේළි සැදී අගනෝ....<br>2.ජලය සොඳයි බැසලා....<br>3.ලත් පමණට මැටි...... | 4.1.2<br>ලී කෙළි හා කළ ගෙඩි කවි ගයමු. | 2 |
| | | | | පළමු වන වාරය කාලච්ඡේද එකතුව | 13 |